# දැන්වීමයි

## මහපොළ ශිෂ්‍යත්ව සහතික ප්‍රදානය - 2020

## 2018/2019 අධ්‍යයන කාණ්ඩය

ඉහත අධ්‍යයන කාණ්ඩ සිසුන් සඳහා මහපොළ ශිෂ්‍යත්ව සහතික ලබා දීමට නියමිත දින සහිත කාල සටහන මේ සමඟ ඉදිරිපත් කර ඇත. එම කාලසටහනට අනුව ශිෂ්‍යත්ව සහතිකය ලබාගැනීමට අදාල පීඨ සිසුන් එම කාල සටහනේ සඳහන් දිනටම පැමිණීම අනිවාර්යය වන අතර, එසේ නොපැමිණෙන සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව සහතික නැවත හරවා යවනු ලැබේ.

අසනීප වීම නිසා හෝ විභාග සඳහා සහභාගී වන සිසුන් මහපොළ ශිෂ්‍යත්ව සහතිකය එම කාල සටහනට අනුව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් ඒ සඳහා වෛද්‍ය වාර්තාවක් හෝ විභාගය සඳහා ලබාදෙන ප්‍රවේශපත්‍රය පමණක් ඉදිරිපත් කිරීම සඳහා අවසර ලබාදී ඇත.

මහපොළ ශිෂ්‍යත්ව සහතික ලබා දීම පීඨ මට්ටමින් මහපොළ ශිෂ්‍යත්ව අංකයට අනුව සිදුවේ. <u>මහපොළ ශිෂ්‍යත්ව සහතික ලබාගැනීමේ දී ශිෂ්‍යත්ව අංකය දැනගැනීම අනිවාර්යය වේ. එය දැන ගැනීම සඳහා අවශ්‍ය ශිෂ්‍යත්ව අංකය සහිත මහපොළ ශිෂ්‍යත්වය සඳහා තෝරාගත් නාම ලේඛනය සහ පීඨ මට්ටමින් සහතික ලබාදෙන දින සහිත කාල සටහන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇත.</u>

සහතිකය ලබාගැනීමට පැමිණීමේ දී පහත දෑ රැගෙන ඒම අනිවාර්යය බව මෙයින් දැනුම් දෙමි.

1. **ජාතික හැඳුනුම්පත**
2. **ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත**
3. **බැංකු ගිණුමේ ගිණුම් අංකය සහිත පිටුවේ ඡායා පිටපත**

## සහතිකය ලබාදෙන ආකාරය.

1.සහතිකය ලබා ගැනීමට පෙර, රෝස පැහැති ශිෂ්‍ය ප්‍රකාශය සහිත ගිණුම් විස්තර සදහන් කලයුතු පෝරමය ලබාගතයුතු වේ. එහි බැංකු ගිණුමේ විස්තර සහ ශිෂ්‍යයාගේ විශ්වවිද්‍යාලයේ තොරතුරු සටහන් කරන්න.

2.දත්ත ඇතුලත් කොට පුරවන ලද පෝරමය, ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ බැංකු ගිණුමේ ඡායා පිටපතක් සමඟ භාර දෙන්න.

3.එම දත්ත සටහන භාරදීමෙන් පසු සහතිකය ලබාගත හැක.

4.සහතිකය ලබා ගැනීමේ දී සිසුන් තම අත්සන යෙදීම අනිවාර්යය වේ.

සහතික ප්‍රදානය කරනු ලබන කාල සටහන විශ්වවිද්‍යාලයීය වෙබ් පිටුවේ සහ අදාල පීඨයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇත.

නියෝජ්‍ය ලේඛකාධිකාරී / ශිෂ්‍ය සුභසාධක අංශය.
2020.08.21

...uty Registrar
... Division
Univ... ...nepura